**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2018/2019**

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2021 අගෝස්තු, සැප්තැම්බර්)**

# BLE 207(a) - වාණිජ නීතිය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය තුනයි. (03)

(04) අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු පිළිතුර තුළ අඩංගු විය යුතුය.

(05) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(07) ප්‍රශ්න පත්‍රයේ යම් පිටවුක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(08) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

**01.** පහත සිදුවීම ආශ්‍රයෙන් ලබා දී ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

සමන් සිය සුරතල් බලු පැටියා නැති වූ බවට දැන්වීමක් පලකරන අතර, බලු පැටියා සොයා දෙන්නෙකුට රුපියල් 25000/- ක මුදලක් ලබා දෙන බව දැන්වීමේ දක්වා සිටී. කමල් විසින් බලු පැටියා සොයා ගන්නා අතර, බලු පැටියා භාරදීම සඳහා රුපියල් 35000/- ක මුදලක් ඉල්ලා සිටී. සමන් එය ප්‍රතික්ෂේප කරන අතර, පසුව කමල් රුපියල් 25000/- ක මුදලක් ලබා ගෙන බලු පැටියා ලබා දීමට එකග වේ.

අ ) වලංගු ගිවිසුමක් යන්න පහදා දී වලංගු ගිවිසුමක් ඇති වීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යයතා පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

ආ ) ඉහත සිද්දිමය සාධක අනුව වලංගු අර්පනයක් හා ප්‍රතිග්‍රහණයක් සිදුවී තිබේද? ඔබේ පිළිතුර නඩු තීන්දු නීතිය මගින් පහදන්න.

**(ලකුණු 10)**

**02.** ගිවිසුම් නීතිය ඇසුරෙන් පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

අ) කොන්දේසි (Conditions) හා ප්‍රතිඥා භාර (Warranty)

**(ලකුණු 05)**

ආ) සාධාරණ හේතුව (justa causa) හා අගනා ප්‍රතිෂ්ඨාව (Valuable Consideration)

**(ලකුණු 05)**

ඇ) වගකීමෙන් මුක්ත වීමේ වගන්ති (Exclusion Clauses)

**(ලකුණු 05)**

ඈ) පොදු වැරදීම (Common Mistake)

**(ලකුණු 05)**

**03.** "භාණ්ඩ මිලට ගැනීමේදී 'ගැණුම්කරු ප්‍රවේශම් වෙනු' (caveat emptor) යන්න පොදු නියමය වුවත්, 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ ආඥා පනත මගින් හදුන්වා දී ඇති ව්‍යංග කොන්දේසි මේ සඳහා ව්‍යතිරේක සපයයි."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කරමින් විවේචනාත්මකව විමසන්න.

**(ලකුණු 20)**

**04.** 1896 අංක 11 දරන භාණ්ඩ විකිණීමේ අඥා පනත මගින්, නිශ්චිත භාණ්ඩවල හිමිකම (Property in the goods) මාරු වීම සම්බන්ධයෙන් පනවා ඇති රීති පිළිබඳව ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් විග්‍රහ කරන්න.

**(ලකුණු 20)**

**05.**

අ) නියෝජ්‍යත්ව සම්බන්දයක් යන්න නියෝජ්‍යයත්ව නීතිය ඇසුරින් පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) අපරානුමිත කිරීම හරහා නියෝජ්‍යත්ව සම්බන්දයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය කොන්දේසි මොනවද යන්න විග්‍රහ කරන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කල යුතු වේ.

**(ලකුණු 15)**

**06.**

අ) විනිමය බිල් පතක් යන්න නිර්වචනය කරන්න.

**(ලකුණු 05)**

ආ) යථා පරිදි දරන්නා (Holder in due course ) යන්න නිර්වචනය කරන්න.

**(ලකුණු 05)**

ඇ) රේඛණය කළ චෙක් පතක් සම්බන්දයෙන් එකතු කිරීමේ බැංකුවක් (Collecting bank) හා ගෙවීමේ බැංකුවක් (Paying bank) සතු ව්‍යවස්ථාමය වගකීම සාකච්ඡා කරන්න.

**(ලකුණු 10)**

**07.**

අ) සමාගම් නීතිය යටතේ එන 'සොලමන් මූලධර්මය' (Salomon Principle) පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

ආ) ශ්‍රී ලංකාව තුළ පෞද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීමේදී අනුගමනය කළ යුතු පියවර සැකෙවින් විස්තර කරන්න.

**(ලකුණු 10)**

**08.** පහත සඳහන් මාතෘකා ඇසුරෙන් ඕනෑම 04 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

**(එක් කොටසකට ලකුණු 05 බැගින් හිමිවේ.)**

අ) රේඛණය කළ චෙක් පත් (Crossed Checks )

ආ) ඒක පාර්ශවිය අර්පණ (Unilateral Offers)

ඇ) නොසැලකිලිමත් අවනිදේශනය (Negligent Misrepresentation)

ඈ) උත්තර්ජනය (Duress)

ඉ) අත්‍යාවශ්‍යතාවයේ නියෝජ්‍යත්වය (Agency of Necessity)

ඊ) අසාධාරණ ගිවිසුම් නියම (Unfair Contractual Terms)

**********************